# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1943/4 - 2015 නොවැම්බර් මස 30 වැනි සඳුදා - 2015.11.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/10/07/2013

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.03.17 දිනැති හා අංක 1854/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2014.02.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් දෙමටගොඩ, බේස්ලයින් මාවත, නො. 51/60 හි පදිංචි කේ. පී. සුගතදාස පීරිස් මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුල පාර, නො. 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2015.08.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2015 නොවැම්බර් මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR/10/07/2013

කාර්මික අධිකරණයේ දී ය.

කේ. පී. සුගතදාස පීරිස් මයා,
නො. 51/60, බේස්ලයින් මාවත,
දෙමටගොඩ.

- ඉල්ලුම්කරු -

නඩු අංකය : A - 3541

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
නො. 200, කිරුල පාර,
කොළඹ 05.

- වගඋත්තරකරු -

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් 2014.02.18 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

02. ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ :-

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කටුබැද්ද ඩිපෝවේ ගබඩා පාලක ලෙස සේවය කළ කේ. පී. සුගතදාස පීරිස් මහතාට එරෙහිව පවත්වන ලද විනය විභාගය හේතුවෙන් වැඩ තහනම්ව සිටි කාලයට වැටුප් නොගෙවීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න සහ එසේ අසාධාරණයක් සිදු වූයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

03. කම්කරු කොමසාරිස්ගේ යොමුවේ සඳහන් ආරවුලට අදාළව දෙපාර්ශ්වයන්ගේ පිළිතුරු ප්‍රකාශ සහ ප්‍රතිප්‍රකාශ විශ්ලේෂණය කිරීමෙන් පසු විභාගය 2014.09.12 වෙනි දින පෙරවරු 10.00 ට ආරම්භ කරන ලදී.

04. එදින ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත ශ්‍රේෂන් සිල්වා මහතා පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ ආර්. ගුණරත්න මහතා පෙනී සිටියේය. වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් ලිපිකාරිනි ශ්‍රියා කරුණාරත්න මහත්මිය සමග නීති නිලධාරිනි නිමේෂා අයන්ති මහත්මිය පෙනී සිටියාය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. බේරුම්කරණයට යම් කම්කරු ආරවුලක් සම්බන්ධයෙන් බලය ලැබෙන්නේ කම්කරු කොමසාරිස්ගේ යොමුවෙහි (Reference) මෙම පරීක්ෂණයට අදාළ යොමුවේ මෙසේ සඳහන් වේ.

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කටුබැද්ද ඩිපෝවේ ගබඩා පාලක ලෙස සේවය කල කේ. පී. සුගතදාස පීරිස් මහතාට එරෙහිව පවත්වන ලද මූලික විමර්ශනය හේතුවෙන් වැඩ තහනම්ව සිටි කාලයට එනම්, 2008.11.25 වෙනි දින සිට 2009.07.16 වෙනි දින දක්වා වැටුප් නොගෙවීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වුයේ නම් ඔහුට කුමන සහනයක් හිමිවිය යුතු ද යන්න පිළිබඳව වේ.'' වේතන නොගෙවන ලද කාල සීමාව 2008.11.25 වෙනි දින සිට 2009.07.16 වෙනි දින දක්වා බැව් ඉල්ලුම්කරු කාර්මික අධිකරණයේ ලේඛකාධිකාරි වෙත යවන ලද 2014.04.17 වෙනි දිනැති ලිපියේ සඳහන් වේ.

06. කම්කරු කොමසාරිස්ගේ අත්සනින් යුතු යොමුවේ සඳහන් ආරවුල ඉතා සරලය. එහෙත් සාක්ෂි මෙහෙයවීමේදී සහ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දීමේදී රජයේ ආයතන සංග්‍රහය සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය රෙගුලාසි මිශ්‍ර කර ප්‍රශ්න විමසීමේදී සහ ඒවාට පිළිතුරු සැපයීමේදී ආරවුල ගැටළු සහගත ප්‍රශ්නයකට පරිවර්ථනය වීමෙන් ප්‍රශ්නය අනවශ්‍ය ලෙස දිග්ගැස්සී ඇති අතර, ඉල්ලුම්කරුට සහනයක් ලබාදීම යම් තරමකට ප්‍රමාද වී ඇත.

07. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ 1:1: II අනුව ''රජයේ නිලධාරියා'' යන්නෙන් අදහස් කෙරෙන්නේ රජය යටතේ වැටුප් සහිත ඕනෑම ධූරයක් උසුලන ඕනෑම තැනැත්තෙකු වන අතර, එම වගන්තියේ ''අ'' සිට ''ඕ'' අනුව රජය වෙත පවරනු ලැබ ඇති ආයතනවල ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සේවකයෝ රජයේ සේවකයින්, රජයේ නිලධාරීන් නොවන බැවින් ද ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකයින් නොවන නිසා, රජයේ නිලධාරීන් නොවන නිසා විනය කටයුතු සඳහා ආයතන සංග්‍රහය යොදා ගත නොහැකිය. (රජයේ ආයතන සංග්‍රහයේ 20-21 පිටු) එසේ වුවත් අදාළ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල විසින් ආයතන සංග්‍රහ අනුමත කර ඇත්නම් එසේ අනුමත කරන ලද දිනයේ සිට ආයතන සංග්‍රහය යොදාගත හැකිය. මෙම බේරුම්කරණ නඩුවේදී වගඋත්තරකාර පාර්ශ්වය විසින් ලංකා ගමනාගමන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි යෝජනාවක් සම්මත කර ඇති බවට ලියවිල්ලක් ඉදිරිපත් කර නැත.

08. ඉල්ලුම්කාර පාර්ශ්වයේ නියෝජිත තැන විසින් පෙන්නුම් කර ඇති පරිදි විනය පරීක්ෂණය සිදු කළ යුතුව ඇත්තේ ගමනාගමන මණ්ඩලයේ විනය රෙගුලාසිවලට අනුකූලව බව තහවුරු කිරීමය ගමනාගමන මණ්ඩලයේ විනය රෙගුලාසි 6(1) වගන්තිය A/03 වශයෙන් පැමිණිලිකාර පාර්ශ්වය විසින් සලකුණු කරන ලදී. (160 පිටුව) මේ කරුණු අනුව මෙම විධිමත් විනය පරීක්ෂණය මූලික විමර්ශනයේ සිට කල යුතුව තිබුණේ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය රෙගුලාසි යටතේ පැවැත්විය යුතු බැව් පැහැදිලි විය.

09. මූලික විමර්ශනයෙන් පසුව ඉල්ලුම්කරුට වරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර, එම චෝදනා පත්‍රය R/08 වශයෙන් වගඋත්තරකාර පාර්ශ්වය සලකුණු කොට බේරුම්කරණ නඩුවටද ගොනු කරන ලදී. එම චෝදනා පත්‍රය චෝදනා 05 කින් සමන්විතය. විනය විභාග නිලධාරී (බී) කො. ප්‍රා. පා. කාර්යාලය නුගේගොඩ විසින් විනය විභාගය පවත්වා ඔහුගේ නිගමනය R/19 ලෙස සලකුණු කරන ලදී. එම නිගමන ශ්‍රී ලංගම කොළඹ ප්‍රාදේශිකයේ ජ්‍යෂ්ඨ විනය නිලධාරි, කොළඹ ප්‍රාදේශිකය විසින් පහත සඳහන් දඬුවම් චූදිතට විරුද්ධව පමුණුවන ලදී.

01. දින හතක් (07) වේතනය දඩ වශයෙන් අයකර ගැනීම.

02. ඉදිරි සේවා කාලය තුළදී මෙවැනි චෝදනාවන්ට ලක් නොවන ලෙසට තරයේ අවවාද කිරීම.

10. ඉහත සඳහන් දඬුවම් හැර වෙනත් දඬුවමක් ඉල්ලුම්කරුට ලබා දී නැත. මෙම දඬුවම් අනුව චූදිත (එනම්, ඉල්ලුම්කරු) වැඩ තහනමකට ලක් නොවන චෝදනා 05 කට ලක් වී ඇති බව සැලකිය හැකිය. වැඩ තහනමට ලක්වී ඇති කාලය තුළ ඔහුගෙන් අඩුකර ගන්නා ලද වේතනය ගැන කිසිම සඳහනක් විනය නියෝගයේ සඳහන් නොවේ.

11. කෙසේ වෙතත් මෙම දඬුවමට එරෙහිව ඉල්ලුම්කරු විසින් අභියාචනයක් අභියාචනා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, අභියාචනා මණ්ඩලයේ සභාපති ඇතුළු නිලධාරීන් තිදෙනෙකු එක්වී චූදිත වෙත නිකුත් කර ඇති අභියාචනා නියෝගය R/21 ලෙස වගඋත්තරකාර පාර්ශ්වය විසින් බේරුම්කරණ නඩුවට ගොනු කරන ලදී. දින තුනක වේතන දඩ නියම කිරීම අභියාචනා මණ්ඩලයේ තීරණය බව R/21 හි සඳහන් වේ.

මෙම අභියාචනා නියෝගයෙන් ද පැහැදිලි වන්නේ ඉල්ලුම්කරු වැඩ තහනමකට ලක් කිරීම හෝ එම කාල සීමාව තුළදී ඔහුට වේතන අහිමි කිරීම සාධාරණ නොවන බවයි.

12. ඉල්ලුම්කරු 2009.08.09 වෙනි දින සිට සේවයෙන් විශ්‍රාම ගන්වා ඇත. ඒ වන විට ඔහුගේ වයස අවුරුදු 55 ක් වූ බැව් පෙනේ. මෙම නඩු තීන්දුවෙන් ඔහු විශ්‍රාම නොගැන්වූයේ නම් තව අවුරුදු කීපයක් ලංගමයට සේවය කිරීමට හැකියාවක් තිබුණි. ඔහුගේ වැඩ තහනම් කිරීමක් කිරීමේ කාලයට වේතන නොගෙවීමත් නිසා ඔහුට බලවත් අසාධාරණයක් සිදුව ඇති බැව් පෙනී යයි.

13. එබැවින් ඉල්ලුම්කරුගේ සේවය තහනම් කල කාලය තුළ මණ්ඩලය විසින් රඳවා ගන්නා ලද සම්පූර්ණ වේතන සහ දීමනා නිවැරදි ලෙස ගණන් බලා මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කල දින සිට මසක් ඇතුළත ඉල්ලුම්කරුට ගෙවන ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට මම නියෝග කරමි.

නීතිඥ ටී. පියසෝම,
බේරුම්කරු.

වර්ෂ 2015ක් වූ අගෝස්තු මස 30 වැනි දින.

12-470

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.